# විද්‍යුත් තොරතුරු මූලාශ්‍රයඃ විෂය බිහිදොර (Subject Gateways) සහ වෙබ් පෝටල් (Web Portals)

එම්. ජී. අරුණ තිලංක

**සංක්ෂිප්තය**

දැනුම වනාහි පරම්පරාවෙන් පරම්පරාවට අවිච්ඡින්නව සන්නිවේදනය වන්නකි. මානව ශිෂ්ටාචාරයේ ආරම්භයේ සිට අද දක්වා ම, මානවයා සොයා ගත් දැනුම ලේඛනගත කිරීම සඳහා විවිධ මාධ්‍යය භාවිත කර ඇති බවට පුරාවිද්‍යාත්මක සාක්ෂ්‍යය බොහෝ ය. අපරදිග ශිෂ්ටාචාරවාසීන් මැටිපුවරු, පැපිරස්, පාච්මන්ට්, වෙලම් ආදිය ද, පෙරදිග රටවල පුස්කොළ, ශිලා, රෙදි, ගස්පොතු ආදි නොයෙක් මාධ්‍යය ද ලේඛනය සඳහා බහුලව උපයෝගී කරගෙන ඇති බව පෙනේ. පශ්චාත්කාලීනව ක්‍රි. පූ. 105 දී චීන ජාතික සායි ලූන් කඩදාසිය ලොවට හඳුන්වා දීමත්, ක්‍රි. ව. 1456 දී ජොහැන්ස් ගුටෙන්බර්ග් මුද්‍රණ යන්ත්‍රය නිර්මාණය කිරීමත් ලේඛන සම්ප්‍රදායේ නවලක්ෂ්‍යයක් ඇති කරන්නට සමත් වූ බවට වන ප්‍රකාශ අවිවාදිතය. එසේම දහනමවන සියවසේ මැදභාගයේ සිදු වූ නූතන තාක්ෂණික විප්ලවය නිසා එක්වරකදී පොත් සිය දහස් ගණනක් මුද්‍රණය කළ හැකි යන්ත්‍ර නිර්මාණය වීම ප්‍රකාශන මාධ්‍යයයෙහි ශීඝ්‍ර සංවර්ධනයට හේතු විය. එම නිසා දැනුම උත්පාදනය, ප්‍රකාශනය, ප්‍රසාරණය හා සන්නිවේදනයෙහි බහුවිධ ස්වරූප ඇති විය. ඒ අතුරින් විද්‍යුත් තොරතුරු මූලාශ්‍රය ප්‍රධාන වන අතර, ඉන් විෂය බිහිදොර (Subject Gateways) හා වෙබ් පෝටල් (Web Portals) මිනිසාගේ දෛනික තොරතුරු අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා යොදා ගත හැකි තොරතුරු මූලාශ්‍රය ලෙස වඩාත් අගය කළ හැකිය.

ප්‍රමුඛ පදඃ විද්‍යුත් තොරතුරු මූලාශ්‍රය, විෂය බිහිදොර, වෙබ් පෝටල්, විද්‍යුත් පුස්තකාල

**විෂය බිහිදොර (Subject gateways)**

විෂය බිහිදොර (Subject gateways) යනු එක් විෂයක් හෝ තෝරාගත් සුවිශේෂී විෂය පරාසයක් සඳහා ප්‍රවේශ සපයන, එමෙන් ම තොරතුරු ජාලයක් ලෙස පවත්වාගෙන යනු ලබන විද්‍යුත් තොරතුරු මූලාශ්‍රයක් ලෙස නිර්වචනය කළ හැකිය. විෂය බිහිදොර යන්නෙහි ගම්‍යවන අර්ථ කිහිපයකි. එනම්, තොරතුරු සඳහා වන දොරටුවක්; ප්‍රවේශයක්; මාධ්‍යයක් යනුවෙනි.

> "Subject gateways are internet search engines that search directories of websites relevant to particular subjects.'' (Koch, 2000: 24-25p.) විෂය බිහිදොර යනු උපයෝජකයන්ට අන්තර්ජාලය තුළ සාධිකාරී මූලාශ්‍රය සොයා ගැනීමට උපකාරී වන නාමාවලි සහිත විද්‍යුත් සෙවුම් යන්ත්‍රයකි.

> "Subject gateways are internet - based services designed to help users locate high quality information that is available on the internet. They are typically, database of detailed metadata (or catalogue) records which describes internet resources and offer a hyperlink to the resource.'' (Place, 2000: 52-56p.) විෂය බිහිදොර අන්තර්ජාලය තුළ ඇති උසස් ප්‍රමිතියකින් යුත් තොරතුරු සොයා ගැනීමට උපකාරීවන මෙවලමකි. මෙහි දී සූචියකට හෝ නිශ්චිත ක්‍රමවේදයකට (අනුක්‍රමයකට) අනුව පෙළ ගස්වා ඇති තොරතුරු වෙත යොමු ලබා දීම සිදු කෙරේ.

> "A process of identification, filtering, description, classification and indexing before they are added to databases which is freely available via a WWW.'' (Moffat) විෂය බිහිදොර මගින් අන්තර්ජාලය තුළ අන්තර්ගත තොරතුරු මූලාශ්‍රය හඳුන්වාදීම, උපයෝජකයාට අවශ්‍යය තොරතුරු පමණක් පෙන්වීම, විස්තර, වර්ගීකරණය හා අනුක්‍රමණිකා සකසා ඉදිරිපත් කෙරේ.

විෂය බිහිදොර හැඳින්වීම සඳහා භාවිත කළ හැකි පර්යාය පද බොහෝය. විෂය ප්‍රවීණයන් එම පර්යාය පද ඉදිරිපත් කර ඇත්තේ විෂය බිහිදොරවල ස්වරූපය, අන්තර්ගතය හා සේවා විවිධත්වය මනාව අධ්‍යයනය කරමිනි. (Heery, 2000: 40-45)

විෂය මූලික තොරතුරු බිහිදොරකි. (Subject – based Information Gateways)

විෂය මූලික බිහිදොරකි. (Subject based Gateways)

විෂය අනුක්‍රමණිකා බිහිදොරකි. (Subject Index Gateways)

අතථ්‍ය පුස්තකාල සේවාවකි. (Virtual Libraries)

නිෂ්කාෂනාගාරයකි. (Clearinghouse)

විෂය රුක් සටහනකි. (Subject Trees)

ගවේෂකයෙකි. (Pathfinder)

තත්ත්ව සහතික විෂය බිහිදොරකි. (Quality – controlled Subject Gateways)

විෂය බිහිදොරක දැකිය හැකි ඊට ආවේණික ලක්ෂණ කිහිපයකි. එනම්, උපයෝජකයන්ට තම තොරතුරු අවශ්‍යතා විශ්වාසනීයව, ඉක්මනින් හා පහසුවෙන් අත්පත් කර ගැනීම උදෙසා පහසුකම් ලබා දී ඇත (Mackie and Button, 1999: 327-337p.). එසේම විෂය බිහිදොරක,

තොරතුරු කළමනාකරණය කරන්නේ විෂය ප්‍රවීණයන් විසිනි.

අන්තර්ගත තොරතුරු මූලාශ්‍රය සාධිකාරී වේ.

අනවශ්‍ය තොරතුරු අත්හැර, අවශ්‍ය තොරතුරු පමණක් සොයන්නන්ට ලබාදේ.

තොරතුරු උපුටා ගැනීමේ දී බාධා ඇති නොවේ.

සාරාංශයක් මගින් අන්තර්ගතය පිළිබඳව දැනුමත් කෙරේ.

සුවිශේෂී විෂයයන්ට ප්‍රවේශ සපයයි.

ඉක්මන් ප්‍රවේශය හා ගුණාත්මක මූලාශ්‍රය භාවිතයට ඉඩ ලැබේ.

බොහෝ විට නොමිලේ තොරතුරු මූලාශ්‍රය වෙත ප්‍රවේශය ලබා දෙයි. එම නිසා පරිශීලකයන්ගේ නම (User name) හෝ මුරපද (Passwords) යෙදීම අවශ්‍ය නොවේ.

අධ්‍යයන, පර්යේෂණ වැනි ඉලක්කගත කණ්ඩායම් සඳහා තොරතුරු පෙළ ගස්වා ඇත.

අන්තර්ජාලය තුළ ඇති බොහෝ තොරතුරු අසංවිධානාත්මක හා විසිරී ගොස් ඇත. එම නිසා ගවේෂකයාට බොහෝ වෙහෙසක් හා වැඩි කාලයක් ඒ වෙනුවෙන් කැප කරන්නට සිදු වේ. තව ද යම් විෂයකට අදාළ හා අදාළ නොවන තොරතුරු විශාල ප්‍රමාණයක් පිළිවෙළකින් තොරව එකවර ලබා දීම නිසා, ගවේෂකයාට තොරතුරුවල නිරවද්‍යතාව හා සාධිකාරීත්වය පිළිබඳ යම් ගැටලු ඇති විය හැකිය. ඊට විසඳුමක් ලෙස විෂය බිහිදොර සාධිකාරී තොරතුරු මූලාශ්‍රයක් ලෙස භාවිත කළ හැකිය.

විෂය බිහිදොර සඳහා උදාහරණ

Social Sciences Information Gateway (SOSIG)

Library and Information Science Gateway (LIS gateway)

Edinburgh Engineering Virtual Library (EEVL)

The Virtual Library (Vlib)

Librarian's Index to the Internet (LII)

Gateway to Development Information (Eldis)

Resource Discovery Network (RDN)

Economic and Business Gateway (Bized)

**වෙබ් පෝටල් (Web Portals)**

වෙබ් පෝටල් (Web Portals) විෂය බිහිදොර වැනි ම ජාලගත තොරතුරු සේවාවකි. දත්ත ගබඩාවල ඇති සංවිධානය නොවූ තොරතුරු රැස් කිරීම, කළමනාකරණය, බෙදාහැරීම හා භාවිත කිරීමට පහසුකම් සපයන තොරතුරු පද්ධතියක් ලෙස වෙබ් පෝටල් හැඳින්විය හැකිය. (Dias: 2001, 269p.) වෙබ් පෝටල්වල ඊට ආවේණික සුවිශේෂී තොරතුරු සේවා රැසක් දැක ගත හැකි වේ. විශේෂයෙන් ම උපයෝජකයන්ගේ පුද්ගලිකවූත්, පොදුවූත් තොරතුරු අවශ්‍යතා සම්පූර්ණ කර දෙනු ලබන සජීවී, විද්‍යුත් මූලාශ්‍රයක් ලෙසත්, හරස් සෙවුම් භාවිත කොට ගවේෂණය කළ හැකි තොරතුරු ජාලයක් ලෙසත් ''වෙබ් පෝටල්'' අගය කළ හැකිය.

වෙබ් පෝටල් යනු අන්තර්ජාලය තුළ විසිරී පැතිරී ඇති මූලාශ්‍ර/සම්පත් වෙත හරස් යොමු (cross-searching) ප්‍රතිඵල (harvesting), හා ඉඟි ලබාදීම (alerting) වැනි තාක්ෂණික උපක්‍රම මගින් ප්‍රවේශ ලබා දෙන ජාලගත සේවාවකි. මෙමගින් ගවේෂකයන්ට එකතැනකින් බහුවිධ තොරතුරු අවශ්‍යතා සම්පූර්ණ කර ගත හැකිය (Kerr and Macleod: 1997,110p).

වෙබ් පෝටලයක් භාවිත කිරීමෙන් ගවේෂකයෙකුට වැදගත් තොරතුරු රාශියක් ලබා ගත හැකිය. මෙහි ඇති විශේෂත්වය වන්නේ, එක් විෂය පරාසයකට සීමා නොවී තොරතුරු සපයන නිසා පරිශීලකයන්ගේ බහුවිධ තොරතුරු අවශ්‍යතා එක ප්‍රවේශයකින් සම්පූර්ණ කරගැනීමට හැකි වීමයි. (Dias: 2001, 272-287p.) වෙබ් පෝටලයකින් ලබා ගත හැකි තොරතුරු බොහෝය.

නව තොරතුරු (යම් සිදුවීමක එසැණ තතු)

රැකියා අවස්ථා

කාලගුණික තොරතුරු

විනෝදාත්මක දෑ

බහු භාෂාමය තොරතුරු

රාජ්‍යය නිල තොරතුරු

සමුළු, සම්මන්ත්‍රණ තොරතුරු

නොමිලේ මෘදුකාංග ලබා ගැනීමට

මෘදුකාංග හඳුනා ගැනීමට

තොග මිල හා විනිමය අනුපාතය යනාදිය දැන ගැනීමට හැකිය.

මෙහි දී පරිශීලකයාට විද්‍යුත් තැපැල (E-mail), ප්‍රවෘත්ති (News), සබැඳි (Links), දත්තපදනම් (Data bases), මාර්ගගත සංවාද (Online Forums) වැනි විවිධ ක්‍රම ඔස්සේ වෙබ් පෝටලයකින් තොරතුරු දැන ගැනීමට හැකි වේ. ජාල පද්ධතියකින් සැදුම් ලත් සේවාවක් වන වෙබ් පෝටලයක පැතිරුණු, පුළුල් තොරතුරු එකතුවක් අන්තර්ගත වේ. වෙබ් පෝටලයක් මගින් තොරතුරු ඉලක්කගතව ඉදිරිපත් නොකරන අතර, කෙනෙකුට යම් අවශ්‍යතාවයක පමණක් පිවිස තොරතුරු ලබා ගැනීමේ හැකියාව පවතී. නමුත් මෙහි දැකිය හැකි ප්‍රධාන දුර්වලතාවය වන්නේ තොරතුරු නිර්මාණය හා යාවත්කාලීන කරන්නන් පිළිබඳ සඳහන් නොවීමයි. එමනිසා තොරතුරුවල වලංගුතාව හා නිරවද්‍යතාව පිළිබඳ ගැටලු ඇතිවීමට වැඩි ඉඩක් තිබේ. පහතින් විවිධ ක්ෂේත්‍ර කේන්ද්‍රව පවත්වාගෙන යනු ලබන වෙබ් පෝටල කිහිපයක් සඳහා උදාහරණ සපයා ඇත.

**රාජ්‍ය වෙබ් පෝටල් (Government Web Portals)**

ශ්‍රී ලංකා රජයේ නිල අන්තර්ජාල බිහිදොර (http://www.gov.lk)

ඔස්ට්‍රේලියානු රජයේ නිල අන්තර්ජාල බිහිදොර (australia.

gov.au)

**සංස්කෘතික වෙබ් පෝටල් (Cultural Web Portals)**

සංස්කෘතික මධ්‍යස්ථාන බිහිදොර (centers.cultural.gov.lk)

ඉන්දියානු සංස්කෘතික බිහිදොර (indianculture.gov.in)

**පොදු වෙබ් පෝටල් (Public Web Portals)**

Google

MSN

Yahoo

ප්‍රවෘත්ති වෙබ් පෝටල් (News Web Portals)

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව (dgi.gov.lk)

ජනපතිට කියන්න (tell.president.gov.lk)

මීට අමතරව පුද්ගලික (Presional), සහයෝගී (Coparative) හා දැනුම (Knowledge) යනාදී විවිධ කණ්ඩවලට අයත් වෙබ් පෝටල් ද දැක ගත හැකිය. වෙබ් පෝටලයක ස්වභාවය හා ක්‍රියාකාරීත්වය පිළිබඳ අවබෝධයක් ලබා දීමට ශ්‍රී ලංකා සමාජවාදී ජනරජයේ නිල වෙබ් පෝටලය පිළිබඳ කරුණු පහතින් සාකච්ඡා කෙරේ.

**ශ්‍රී ලංකා රජයේ නිල අන්තර්ජාල බිහිදොර**

ශ්‍රී ලංකා රජයේ නිල අන්තර්ජාල බිහිදොර මගින් ලබාදෙන සියලුම සේවාවන් සිංහල, ඉංග්‍රීසි හා දෙමළ භාෂා මාධ්‍යය භාවිතයෙන් ලබා ගැනීමට හැකිය. මෙම රාජ්‍ය වෙබ් පෝටලය මගින්,

රාජ්‍ය අංශ, දෙපාර්තමේන්තු පිළිබඳ තොරතුරු

කාලගුණ දත්ත

විනිමය අනුපාතය

ජංගම දුරකථන සේවා

ඉ-සෞඛ්‍යය

වෘත්තීය තොරතුරු

යනාදි නිල රාජ්‍යය තොරතුරු හා සේවා ලබා දෙන අතර, එම සේවා ලබා ගැනීමට පෙර ඊට ලියාපදිංචි විය යුතුය. ජංගම දුරකථන සේවාව මගින් මහජනතාවට දුම්රිය කාලසටහන්, මාලු මිල, පොලිස් වාර්තා, ජාතික හැඳුනුම්පත් ඉල්ලුම් කිරීමෙන් පසු පවතින තත්ත්වය ආදි එදිනෙදා ජීවිතයට අවශ්‍ය තොරතුරු ඉතා කඩිනමින් හා යාවත්කාලීනව ලබා ගත හැකිය. එසේම කාලගුණ දෙපාර්තමේන්තුවේ දත්ත මත පදනම්ව ලබා දෙන කාලගුණ අනාවැකි තුළින් ධීවරයන්ට, භෝග වගාකරුවන්ට හා සංචාරකයන්ට තම කටයුතු කරදරයකින් හා බාධාවකින් තොරව සිදුකර ගැනීමට අවශ්‍ය තොරතුරු සපයයි. වෘත්තීය තොරතුරු සේවා යටතේ සියලුම රාජ්‍ය අංශයේ රැකියා පිළිබඳ මහජනතාව දැනුවත් කරනු ලබයි.

### විෂය බිහිදොර හා වෙබ් පෝටල් අතර දැකිය හැකි වෙනස්කම්

විද්‍යුත් තොරතුරු ප්‍රවේශ, ජාල, දොරටු දෙකක් වන විෂය බිහිදොර හා වෙබ් පෝටල් ඊට අනන්‍ය වූ විශේෂාංග හා සේවාවන්ගෙන් යුක්ත වේ. (Marchionini,1995: 5-22p.) ඉහතින් එම මූලාශ්‍රය පිළිබඳ කරුණු දක්වා ඇත. මෙහි දී ඒවායෙහි දැකිය හැකි සම, අසමතා පිළිබඳ කරුණු උදාහරණ ආශ්‍රයෙන් සාකච්ඡා කෙරේ.

වගු අංකː 01

| විෂය බිහිදොර හා වෙබ් පෝටල් අතර පවතින වෙනස්කම් | |
|---|---|
| විෂය බිහිදොර (Subject Gateways) | වෙබ් පෝටල් (Web Portals) |
| විෂය බිහිදොර අන්තර්ජාල සේවාවකි. | වෙබ් පෝටල් ජාලගත සේවාවකි. |
| විෂය සඳහා බිහිදොරක් වේ. | තොරතුරු සඳහා වන බිහිදොරකි. |
| විෂය බිහිදොර කළමනාකරණය (Mata data) කරන්නේ මිනිසුන් විසිනි. | වෙබ් පෝටල් එකක් (Mata data) ස්වයංක්‍රීයව පාලනය වේ. |
| විෂයට අදාළ යොමු (Links) ලබාදෙයි. | බහු විෂයීය යොමු (Links) ලබා දෙයි. |
| තොරතුරු වර්ගීකරණය කෙරේ. | තොරතුරු අනුක්‍රමණිකාගත කෙරේ. |
| විෂය බිහිදොර මගින් අන්තර්ගතය සොයා ගත යුතුය. | වෙබ් පෝටල් මගින් පාඨකයාට අන්තර්ගතය ලබා දෙයි. |
| සෙවීම සඳහා සාමාන්‍ය ක්‍රමවේද උප-යෝගී කර ගත හැකිය. | හරස් යොමු (Cross Searching) භාවිතයෙන් ගැඹුරු සෙවීම් සිදු කළ හැකිය. |
| විෂය බිහිදොරකින් යම් විෂයක් පිළිබඳ දැනුමත් කරයි. | වෙබ් පෝටල් මගින් තොරතුරු මූලාශ්‍රයක සිට තවත් තොරතුරු මූලාශ්‍රයකට ප්‍රවේශ සපයයි. |
| තොරතුරු අවශ්‍යතා හඳුනාගනී. | උපයෝජකයන්ට අවශ්‍ය තොරතුරු ඒකරාශී කරයි. |
| තොරතුරු දිනපතා යාවත්කාලීන නොවේ. | දිනපතා යාවත්කාලීන වේ. |
| විෂය බිහිදොර විෂය ප්‍රවීණයන්ගේ අධීක්ෂණයට ලක් වේ. | වෙබ් පෝටල් දත්ත කළමනාකරු-වන්ගේ අධීක්ෂණයට ලක් වේ. |
| ඉලක්කගත පිරිසකට තොරතුරු සපයයි. | සියල්ලන්ටම තොරතුරු සපයයි. |
| සාධිකාරී මූලාශ්‍රය ලබාදෙයි. | සාධිකාරී නොවන තොරතුරු බහුල වේ. |

**සමාලෝචනය**

වර්තමානයේ බොහෝ තොරතුරු ගවේශකයන් තම විඥාපන අවශ්‍යතා සඳහා අන්තර්ජාලය බෙහෙවින් භාවිත කරනු ලබයි. එම නිසා විද්‍යුත් තොරතුරු මූලාශ්‍රය පිළිබඳ මනා අවබෝධයක් තොරතුරු කළමනාකරුවන්ට තිබිය යුතුය. විෂය බිහිදොර හා වෙබ් පෝටල් අන්තර්ජාලයේ තොරතුරු වෙත පිවිසීමට ඇති ප්‍රධාන දොරටු දෙකකි. ඒ අතුරින් විෂය බිහිදොර යම් සුවිශේෂී විෂය පරාසයක් කේන්ද්‍ර කරගෙන ද, වෙබ් පෝටල තොරතුරු පදනම් කරගනිමින් ද ක්‍රියාත්මක වන බව පැහැදිලිය. තව ද විෂය බිහිදොර හා වෙබ් පෝටල අතර දැකිය හැකි සම අසමතා බොහෝමයකි. ඒ පිළිබඳව ඉහතින් කරුණු සාකච්ඡා කර ඇත. මේ අනුව විඥාපන මධ්‍යස්ථානයකට උපයෝජකයන්ගේ තොරතුරු අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා යොදා ගත හැකි ප්‍රධාන විද්‍යුත් තොරතුරු මූලාශ්‍රය දෙකක් ලෙස විෂය බිහිදොර හා වෙබ් පෝටල් හඳුන්වා දිය හැකිය.

**ආශ්‍රිත ග්‍රන්ථ**

Dias, C., (2001). "Corporate portals: a literature review of a new concept in Information Management", International Journal of Information Management, Vol.21.

Heery, Rachel. (2000). "Information gateways: collaboration on content," online information review, Vol. 24 (1), pp. 40-45.

Kerr, L. and MacLeod, R. (1997). "EEVL: an Internet gateway for engineers," Library Hi Tech, Vol. 15 (3-4)

Koch, Traugott. (2000) Quality-controlled subject gateways: definitions, typologies, empirical overview. Online information review, 24 (1), 24-34.

Place, Emma. (2000). "International collaboration on Internet subject gateways," IFLA Journal, Vol. 26 (1).

Marchionini, G. (1995). Information seeking in electronic environments. Cambridge, Uk: Cambridge University Press.